# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

**අංක 12,846 — 1962 ජනවාරි 5 වැනි සිකුරාද — 5.1.1962**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි, සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවක්ට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට |
|---|---|
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන ප්‍රකාශන ... ... | — |
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ... ... | 9 |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම්... | 10 |
| අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ... | 10 |
| වෙනත් පත් කිරීම් ... ... ... | 12 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත් කිරීම් ආදිය ... ... | — |

| | පිට |
|---|---|
| ආණ්ඩුවේ නිවේදන ... ... ... | 12 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ලංකා මහා බැංකුවේ දැන්වීම් ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... | — |
| ආණ්ඩුවේ වත්කම් හා බැරකම් ප්‍රකාශ ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... | 15 |
| "සුරාබදු ආඥාපනත" පිළිබඳ දැන්වීම් ... ... | — |


[මෙවර ප්‍රසිඩ කරනු ලබන ගැසට් පත්‍රයේ VI වෙනි කොටසේ ලියා පදිංචි කරන ලද ආයුර්වේද වෛද්‍ය වරුන්ගේ නාම ලේඛනය අඩංගු වේ.]

## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම්

**1962 අංක 1**

අංකය : ඩී/වීඑජ්/1/ඒ.

### යුද්ධ හමුදව—ලංකා ස්වේච්ඡා භට සේනාව — අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීමක්

1961 දෙසැම්බර් 1 වැනි දින සිට ලෙප්ටිනන්ට් වශයෙන් :

උප ලෙප්ටිනන්ට් ගාමිණී විජේවර්ධන ජයතිලක, ලං. කා. භ.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඇන්. කෲ. දියෙස්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1961 දෙසැම්බර් 23 වෙනිදා,
කොළඹ දීය.

1-44

**1962 අංක 2**

අංකය : ඩී/වීඑෆ්ජ්/මිශ්‍ර/III.

### යුද්ධ හමුදාව—නිත්‍ය භට සේනාව

අංක 12,788 හා 1961 දෙසැම්බර් මස 1 වැනි සිකුරාදා රජයේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලැබූ 1961 අංක 480 දරණ නිවේදනය සම්බන්ධයෙන් අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද සංශෝධනය.

"1962 ජනවාරි මස 8 වැනි දින ඇතුළුව සහ එදින දක්වා" වෙනුවට
"1962 ජූනි මස 8 වැනි දින ඇතුළුව සහ එදින දක්වා" යොදන්න.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඇන්. කෲ. දියෙස්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1961 දෙසැම්බර් 23 වැනිදා,
කොළඹදීය.

1-116

සෑම සිකුරාද දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිඩ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුද පස්වරු 3.30 ට ප්‍රථමයෙන්).


9—ජේ. ඇන්. බී 38877—4,280 (1/6_)

A

## රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම්

**1962 අංක 3**

රාජ්‍ය සේවා කොමිෂන් සභාව පහත සඳහන් පත් කිරීම් කරන ලෙස නියම කර ඇත්තේ ය :—

ඒ. 288/61.

1961 නොවැම්බර් මස 11 වැනි දින සිට සිවිල් සේවක ඒ. ඇල්. පෙරේරා මහතා දිවයිනෙන් බැහැරව සිටින කාලය තුල හෝ නැවත නියමයක් කරන තුරු මහා භාණ්ඩාගාරයේ සංවිධාන හා ක්‍රම අධ්‍යක්ෂ සිවිල් සේවක වී. ඇම්. පීරිස් මහතා සවකීය රාජකාරිවලට අතිරේකව මහා භාණ්ඩාගාරයේ අර්පික අංශයේ පාලක වශයෙන් වැඩ බැලීමට.

ඒ. 208/61.

1961 දෙසැම්බර් මස 1 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු සිවිල් සේවක වී. ඇම්. අබයසේකර මහතා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂ (පාලනය) වශයෙන් වැඩ බැලීමට.

ඒ. 347/61.

1961 නොවැම්බර් මස 16 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු සිවිල් සේවක ජී. ඇල්. ද සිල්වා මහතා මහා භාණ්ඩාගාරයේ සංවිධාන හා ක්‍රම අංශයේ සහකාර අධ්‍යක්ෂ වශයෙන් වැඩ බැලීමට.

ඒ. 343/61.

1961 දෙසැම්බර් මස 1 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු සිවිල් සේවක ඩී. ජේ. එච්. ගුණසේකර මහතා, දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන පාලක නිලධාරි වශයෙන් වැඩ බැලීමට.

ඒ. 316/61.

1961 නොවැම්බර් මස 4 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ සහකාර කොමසාරිස් ඩී. ජී. ඔබේසේකර මහතා නියෝජ්‍ය කොමසාරිස්වරයෙකු වශයෙන් වැඩ බැලීමට.

සී. ජ. වල්පිට,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1962 ජනවාරි මස 1 වැනි දින,
කොළඹ 1, ගාලු මුවදොර මහ ලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දිය,
තැ. පෙ. 500.

1-151

---

## අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම්

**1962 අංක 4**

අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් පහත සඳහන් පත් කිරීම් කර ඇත්තේ ය :—

අංකය : ජේඑල්. 56ඒ/57.

වී. එස්. සාලි මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, ඊ. ජේ. සී. පීරිස් මහතා 1961 දෙසැම්බර් 22 වැනි හා 23 වැනි දිනයන්හි, පානදුරේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා පානදුරේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 41/ඒ/60.

එස්. ජේ. එම්. ජී. එස්. මුදන්නායක මහතා 1961 දෙසැම්බර් 22 වැනි දින සිට 31 වැනි දින දක්වා නැති අතර, හා නැවතත් එල්. එච්. ද අල්විස් මහතා 1962 ජනවාරි 1 වැනි දින නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, එස්. සෙල්ලතුරේ මහතා නුවර එලියේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, නුවර එලියේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, නුවර එලියේ, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට, හා බදුල්ල-හල්දුම්මුල්ල, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට.

අංකය : ජේඑල්. 6ඒ/48.

ඩී. ජී. එස්. ඩේවිඩ් මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, කේ. වී. එම්. සුබ්‍රමානියම් මහතා 1961 දෙසැම්බර් 22 වැනි දින සිට 1962 ජනවාරි 3 වැනි දින දක්වා, මඩකලපුවේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, හා මඩකලපුවේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඑල්. 67ඒ/58.

ඩබ්ලිව්. ඩී. තාමෝදරම් මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, එස්. ඉලෙයතම්බි මහතා 1961 දෙසැම්බර් 23 වැනි දින සිට 1962 ජනවාරි 8 වැනි දින දක්වා, යාපනේ, මල්ලාකම් පිහිටි උසාවියේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා යපනේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 7ඒ/51.

ඒ. ඕ. එස්. දිසානායක මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, බී. ආර්. ජී. විජේකෝන් මහතා 1961 දෙසැම්බර් 23 වැනි දින සිට 1962 ජනවාරි 2 වැනි දින දක්වා, මහනුවර, මාතලේ පිහිටි උසාවියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, හා මාතලේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඑල්. 61/48.

එන්. සිවඥණසුන්දරම් මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, කේ. රත්නසිංහම් මහතා 1962 ජනවාරි 10 වැනි දින සිට 12 වැනි දින දක්වා හා නැවතත් 1962 ජනවාරි 17 වැනි දින සිට 19 වැනි දින දක්වා, පේදුරු තුඩුවේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, හා පේදුරු තුඩුවේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඑල්. 61/48 (ඒ).

එන්. සිවඥණසුන්දරම් මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, වී. කනගසබේ මහතා 1962 ජනවාරි 8 වැනි, 9 වැනි, 15 වැනි දින සිට 16 වැනි දින දක්වා, පේදුරු තුඩුවේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට හා පේදුරු තුඩුවේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඑල්. 16බී/61.

එන්. ඩබ්ලිව්. දිසානායක මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, එන්. ජේ. වී. කුරේ මහතා 1962 ජනවාරි 1 වැනි දින, කොළඹ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, කොළඹ, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට, හා කොළඹ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 29සී/61.

ඒ. ඩබ්ලිව්. ගුණරත්න සහ එම්. ජමිල් යන මහතුන් නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු ඒ. එම්. අයි. ගුණරත්න මහතා 1961 දෙසැම්බර් 23 වැනි දින සිට 26 වැනි දින දක්වා, මහනුවර, ගම්පොල පිහිටි උසාවියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, හා ගම්පොල අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඑල්. 1ඒ/48.

පී. එස්. ඩබ්ලිව්. අබේවර්ධන මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, වී. එම්. ගුරුසාමි මහතා 1962 ජනවාරි 10 වැනි හා 11 වැනි දිනයන්හි, මහනුවර, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, මහනුවර, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට, දුම්බර, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, මහනුවර, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, හා මාතලේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට.

අංකය : ජේඒ. 40/48.

එස්. පී. විජයතිලක මහතා 1961 දෙසැම්බර් 27 වැනි දින සිට, දඹුල්ලේ මහෙස්ත්‍රාත් උසාවියේ අංක 10,598 දරන නඩුව අවසාන වන තුරු ඇහීමට හා තීන්දුව දීමට, මාතලේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා මහනුවර, මාතලේ පිහිටි උසාවියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 65ඒ/57.

වී. එස්. සාලි මහතා නැවත වැඩ බාරගන්නා තුරු, හෝ නැවත නියමයක් කරන තුරු, ඒ්ජ්. බී. සූරිය බණ්ඩාර මහතා 1961 දෙසැම්බර් 26 වැනි දින සිට, පානදුරේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා පානදුරේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 41ඒ/60.

එස්. ජේ. එම්. ජී. එස්. මුදන්නායක මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, සී. එච්. උදලාගම මහතා 1961 දෙසැම්බර් 28 වැනි හා 29 වැනි දිනයන්හි, කෑගල්ලේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා කෑගල්ලේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 41ඒ/60.

එෆ්. වී. එච්. ලාබ්‍රොයි මහතා ස්ථිර නිලධාරින් නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, 1961 දෙසැම්බර් 28 වැනි දින සිට 1962 ජනවාරි 1 වැනි දින දක්වා, නුවර එළියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, නුවර එළියේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, නුවරඑළියේ අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට, බදුල්ල-හල්දුම්මුල්ල, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට.

අංකය : ජේඑල්. 13ඒ/59.

මහෙස්ත්‍රාත් තැන නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, ආර්. පී. ද සිල්වා මහතා, 1961 දෙසැම්බර් 30 වැනි දින සිට 1962 ජනවාරි 1 වැනි දින දක්වා, බලපිටියේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, හා බලපිටියේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඑල්. 2ඒ/56.

ඩී. එස්. එල්. පී. අබේසේකර මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, සී. ආර්. ද අල්විස් මහතා 1961 දෙසැම්බර් 30 වැනි දින, කොළඹ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, කොළඹ, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට, හා කොළඹ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 29සී/61.

ඒ. ඩබ්ලිව්. ගුණරත්න සහ එම්. ජමීල් යන මහතුන් නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, ඒ එම්. අයි. ගුණරත්න මහතා 1961 දෙසැම්බර් 30 වැනි දින සිට 1962 ජනවාරි 3 වැනි දින දක්වා, මහනුවර, ගම්පොල පිහිටි උසාවියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, හා ගම්පොල අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : පීඑල්/පී. 7/56.

එම්. එම්. පෙරේරා මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, ඒ. ඩබ්ලිව්. ඒ. ඉමැනුවෙල් මහතා 1962 ජනවාරි 1 වැනි හා 2 වැනි දිනයන්හි, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වැළඹිටිලි හත්පත්තුවේ සහ හිරියාල හත්පත්තුවේ ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්/එච්. 2/48.

ඒ. එස්. හේරත් ගුණරත්න මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඒ. පී. රත්නායක මහතා 1961 දෙසැම්බර් 27 වැනි හා 28 වැනි දිනයන්හි, කුරුණෑගල දිස්ත්‍රික්කයේ කටුගම්පොල හත්පත්තුවේ සහ දඹදෙණි හත්පත්තුවේ ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්/එම්. 7/56.

එන්. වී. ටී. මැන්දිස් මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, ඒ. ඩබ්ලිව්. ඒ. ඉමැනුවෙල් මහතා 1961 දෙසැම්බර් 26 වැනි දින සිට 30 වැනි දින දක්වා, කුරුණෑගල දිස්ත්‍රික්කයේ වන්නි හත්පත්තුවේ ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට හා හිරියාල හත්පත්තුවේ ගම්බද උසාවි අතිරේක සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්/ඩී. 2/50.

ඩී. ඩී. විතාරන මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, බී. පී. පියසේන මහතා 1961 දෙසැම්බර් 26 වැනි දින සිට 30 වැනි දින දක්වා මාතර දිස්ත්‍රික්කයේ, වැලිගම් කෝරළේ, වැල්ලබොඩ පත්තුවේ, කඩවත් සතර ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට හා ගඟබොඩ පත්තුවේ ගම්බද උසාවි අතිරේක සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්/ඒ. 9/61.

ඒ. එම්. එම්. අලහුදීන් මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, පී. කුමාරනායගම් මහතා 1961 දෙසැම්බර් 26 වැනි 27 වැනි හා 29 වැනි දිනයන්හි, ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ, කොඩ්ඩියාර් පත්තුවේ ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට හා කඩ්ඩුකුලම් හා තම්පලකාමම් පත්තුවල ගම්බද උසාවි අතිරේක සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඒඒ. මිශ්‍ර/57.

ඩී. පී. බී. මහදිවුල්වැව මහතා 1962 ජනවාරි 1 වැනි දින සිට 6 වැනි දින දක්වා, 8 වැනි, 10 වැනි දින සිට 12 වැනි දින දක්වා, 16 වැනි දින සිට 18 වැනි දින දක්වා, 20 වැනි 22 වැනි දිනද 24 වැනි දින සිට 26 වැනි දින දක්වා, සහ 29 වැනි දින සිට 31 වැනි දින දක්වා, හෝ නැවත නියමයක් කරන තුරු, අනුරාධපුර දිස්ත්‍රික්කයේ උතුරු සහ දකුණු නුරුළු පළාත්වල ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට හා කලාගම් පළාතේ ගම්බද උසාවි අතිරේක සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්/වයි. 3/51.

එන්. එම්. යූසුෆ් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඊ. ජී. බී. පෙරේරා මහතා 1962 ජනවාරි 3 වැනි දින සිට 6 වැනි දින දක්වා, කෑගලු දිස්ත්‍රික්කයේ ගල්බොඩ, කිණිගොඩ, බෙලිගල් සහ පරණකුරු කෝරලයන්හි ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්/වයි. 3/51.

එන්. එම්. යූසුෆ් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඩී. බී. ඩිරැක්ස් මහතා 1962 ජනවාරි 8 වැනි දින සිට 11 වැනි දින දක්වා, කෑගලු දිස්ත්‍රික්කයේ ගල්බොඩ, කිණිගොඩ, බෙලිගල් සහ පරණකුරු කෝරලයන්හි ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්/වයි. 3/51.

එන්. එම්. යූසුෆ් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, සී. එම්. රනතුංග මහතා 1962 ජනවාරි 12 වැනි හා 13 වැනි දිනයන්හි, කෑගලු දිස්ත්‍රික්කයේ, ගල්බොඩ, කිණිගොඩ, බෙලිගල් සහ පරණකුරු කෝරලයන්හි ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්/ආර්. 5/61.

සී. ආර්. රාජසිංහම් මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, එන්. එස්. සිවප්‍රගාසම් මහතා 1961 දෙසැම්බර් 26 වැනි දින සිට 30 වැනි දින දක්වා හා 1962 ජනවාරි 1 වැනි හා 2 වැනි දිනයන්හි, මඩකලපු දිස්ත්‍රික්කයේ ඒරාවූර් කෝරලේ, බින්තැන්න පත්තුවේ හා උතුරු මාන්මුනේ පත්තුවේ ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ වැලීමට.

අංකය : පීඑල්/එන්. 3/59.

ජී. නුගවෙල මහතා නැති අතර, පී. එම්. සෙනෙවිරත්න මහතා 1961 දෙසැම්බර් 30 වැනි දින රත්නපුර දිස්ත්‍රික්කයේ කුරුවිටි කෝරලේ හා කුකුල් කෝරලේ ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට හා නවදුන් කෝරලේ ගම්බද උසාවි අතිරේක සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්/ඊ. 3/56.

ජේ. ඊ. එම්. අයි. ඒකනායක මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඩී. පී. බී. මහදිවුල්වැව මහතා 1961 දෙසැම්බර් 28 වැනි හා 29 වැනි දිනයන්හි, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, උතුරු සහ දකුණු නුරුළු පළාත්වල ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට හා කලගම් පළාතේ ගම්බද උසාවි අතිරේක සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්/යූ. 1/48.

ජී. එම්. උදලාගම මහතා නැති අතර, එම්. ඒ. එල්. අබේසේකර මහතා 1961 දෙසැම්බර් 28 වැනි දින, මහනුවර දිස්ත්‍රික්කයේ, දකුණු මාතලේ සහ නැගෙනහිර මාතලේ ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පී.එල්./ඩබ්ලිව්. 5/48.

එච්. ඊ. එස්. වික්‍රමරත්න මහතා නැති අතර, එම්. ටී. ටී. ද එස්. අමරසේකර මහතා 1961 දෙසැම්බර් 27 වැනි දින බලපිටිය දිස්ත්‍රික්කයේ බෙන්තොට-වලල්ලාවිටි කෝරලේ සහ වැල්ල බොඩ පත්තුවේ ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්/පී. 6/51.

එස්. ජී. පීරිස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, සී. එස්. පිණිදිය මහතා 1961 දෙසැම්බර් 28 වැනි හා 29 වැනි දිනයන්හි මාතර දිස්ත්‍රික්කයේ මොරවක් කෝරලේ ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට හා වැලිගම් කෝරලේ හා ගඟබොඩපත්තුවේ ගම්බද උසාවි අතිරේක සභාපති ධුරයේ වැඩ බැලීමට.

එස්. ආර්. විජයතිලක,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1961 දෙසැම්බර් 29 වැනි දින,
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලය,
තැ.පෙ. අංකය—573,
කොළඹ 12.

1-72

# වෙනත් පත් කිරීම්

## 1962 අංක 5

මගේ අංකය. 28/4/61.

අග්‍රාණ්ඩුකාර උතුමාණන් විහන්සේ ගරු අධිකරණ අමාත්‍යවරයා කෙරෙහි පවරා ඇති බලතල අනුව එතුමා විසින්—

(1) ජී. හෙන්රි මහතා කොළඹ අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවකු වශයෙන්ද,

(2) ඒ. ඩග්ලස් ප්‍රේමරත්න මහතා කෑගල්ල අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවකු වශයෙන්ද,

(3) ඊ. එච්. ඩී. ඇන්තනි අප්පුහාමි මහතා කෑගල්ල අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවකු වශයෙන් ද,

(4) ඒ. ඕ. එම්. ෂරීප් හාජියාර් මහතා මහනුවර අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවකු වශයෙන්ද පත්කර ඇත්තේය.

ජී. පී. ඒ. සිල්වා,
අධිකරණ අමාත්‍යාංශයේ වැඩබලන සථිර ලේකම්.

1962.1.1 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේදීය.

1-161

---

## 1962 අංක 6

1951 කේ අංක 13 දරණ මුස්ලිම් විවාහ හා දික්කසාද ආඥපණතේ 12 (1) වැනි වගන්තිය යටතේ කම්ාන්ත, සවදේශ හා සංස්කෘතික කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් 1962 ජනවාරි මස 1 වැනි දින සිට 1965 දෙසැම්බර් 31 වෙනි දින දක්වා මඩකලපු දිස්ත්‍රික්කයේ කෝරලෙයි පත්තු කොට්ඨාශයේ ක්වාසි තනතුරට වාලෙයිච්චෙනෙයිහි පදිංචි ඉබ්‍රා ලෙබ්බෙ මුස්තාfපා ලෙබ්බෙ හජ්ජියාර් මහතා පත්කරන්ට යෙදුනා ඇත.

එස්. සී. ප්‍රනාන්දු,
කම්ාන්ත, සවදේශ හා සංස්කෘතික
කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ සථිර ලේකම්.

1961 දෙසැම්බර් මස 6 වැනි දින,
කොළඹ.

1-7

---

## 1962 අංක 7

1951 කේ අංක 13 දරණ මුස්ලිම් විවාහ හා දික්කසාද ආඥපණතේ 12(1) වැනි වගන්තිය යටතේ කර්මාන්ත, සවදේශ හා සංස්කෘතික කටයුතු පිළිබඳ ගරු ඇමති තුමා විසින් 1962 ජනවාරි මස 1 වැනි දින සිට 1962 ජූනි මස 30 වැනි දින දක්වා මන්නාරම් දිස්ත්‍රික්කයේ මුසලි කොට්ඨාශයේ ක්වාසි තනතුරට වන්නකුලමේ පදිංචි මීරා නෙයිනා මොහමඩ් රවුතර් මහතා පත් කරන්ට යෙදුනා ඇත.

එස්. සී. ප්‍රනාන්දු,
කර්මාන්ත, සවදේශ හා සංස්කෘතික කටයුතු
පිළිබඳ අමාත්‍යාංශයේ සථිර ලේකම්.

1961 දෙසැම්බර් 18 වැනි දින,
කොළඹ 7.

1-79

---

# ආණ්ඩුවේ නිවේදන

## පඩි පාලක සභා ආඥ පනත (136 වැනි පරිචෙඡදය)

නිවේදනයයි

ගොඩනැගිලි කර්මාන්තය පිළිබඳ පඩි පාලක සභාවේ සාමාජිකයකුව සිට ඉල්ලා අස්වූ ඈfජ්. ජේ. ස්පාක්ස් මහතා වෙනුවට එම පඩි පාලක සභාවේ සේව්‍ය නියෝජිත සාමාජිකයෙකු ලෙස පෙනී සිටීමට පඩි පාලක සභා ආඥ පනතේ (136 වැනි පරිචෙඡදය) 9 වන වගන්තිය යටතේ ගුරු කම්කරු හා ජනසතු සේවා ඇමතිතුමන් විසින් ටී. හටන් මහතා පත් කරණ ලද බව වෂී 1943 පඩි පාලක සහා ව්‍යවසථා සංග්‍රහයේ 26 වන ව්‍යවසථාව යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

වී. ඇස්. ඇම්. ද මෙල්,
සථිර ලේකම්වරයා,
කම්කරු හා ජනසතු සේවා අමාත්‍යාංශය.

1961 දෙසැම්බර් 22 වැනි දින.
කොළඹ දීය.

1-2

---

## පඩි පාලක සභා ආඥ පනත (136 වැනි පරිචෙඡදය)

නිවේදනයයි

පොල් වැවීමේ කර්මාන්තය පිළිබඳ පඩි පාලක සභාවේ සාමාජිකයකුව සිට ඉල්ලා අස්වූ ඊ. මුතුකුමාරු මහතා වෙනුවට එම පඩි පාලක සභාවේ සේව්‍ය නියෝජිත සාමාජිකයෙකු ලෙස පෙනී සිටීමට පඩි පාලක ආඥපනතේ (136 වැනි පරිචෙඡදය) 9 වන වගන්තිය යටතේ ගරු කම්කරු හා ජනසතුසේවා ඇමති තුමන් විසින් ඒ. එච්. කේ. ඕමාර් මහතා පත් කරණ ලද බව වෂී 1943 පඩි පාලක සහා ව්‍යවසථා සංග්‍රහයේ 26 වන ව්‍යවසථාව යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

වී. ඇස්. ඇම්. ද මෙල්,
සථිර ලේකම්වරයා,
කම්කරු හා ජනසතු සේවා අමාත්‍යාංශය.

1961 දෙසැම්බර් 22 වැනි දින,
කොළඹ දීය.

1-3

---

## 1952 කේ නො. 12 දරණ සෞඛ්‍ය සේවා පණත

කුරුණෑගල ආරෝග්‍යශාලා මණ්ඩලය

1952 කේ නො. 12 දරණ සෞඛ්‍ය සේවා පණතෙහි 11 වෙනි වගන්තිය යටතේ 1962 ජනවාරි මස 1 වෙනි දින පටන් 1962 දෙසැම්බර් මස 31 වෙනි දින දක්වා පහත සඳහන් අය කුරුණෑගල ආරෝග්‍යශාලා මණ්ඩලයේ සාමාජිකයින් වශයෙන් ගරු සෞඛ්‍ය ඇමතිතුමා විසින් පත කරනු ලැබූහ. එහි සභාපති වශයෙන් ජිවානන්ද ද සිල්වා මහතා නම් කරනු ලැබිය.

එල්. එස්. බී. පෙරේරා,
ස්ථිර ලේකම්.

1961 දෙසැම්බර් මස 21 වෙනි දින,
කොළඹ, සෞඛ්‍ය අමාත්‍යාංශයේදීය.

### නාම ලේඛනය

1. ජිවානන්ද ද සිල්වා මහතා
2. දොස්තර ඩබ්ලිව්. ඒ. ද සිල්වා මහතා
3. එම්. බී. තෙන්නකෝන් මහතා
4. ඩී. ඊ. බී. ඇඹෝගම මහතා
5. එච්. එම්. පී. ගුණතිලක මහතා
6. ඩබ්ලිව්. ඇම්. මුතුබණ්ඩා මහතා
7. පී. බී. ඒකනායක මහතා
8. ඩී. එම්. ජයතිලක මහතා
9. ආර්. සී. කුලරත්න මහතා
10. ඊ. ඩී. ගුණසේකර මහතා
11. ඩී. ඩබ්ලිව්. ගම්මන්පිල මහතා
12. ඩී. පී. තෙන්නසිංහ මහතා
13. පී. බී. බස්නායක මහතා
14. ඩී. සී. ඩබ්ලිව්. සේනානායක මහතා
15. සෑම්. බුසෙල් මැතිණිය
16. ඒ. එම්. ඒ. අසීස් මහතා
17. මොහන්ලාල් ගුණතිලක මහතා
18. කුරුණෑගල සෞඛ්‍ය සේවා අධිකාරී
19. කුරුණෑගල කොට්ඨාශයේ අධිකාරි ඉංජිනේරු තැන, රජයේ වැඩ දෙපාර්තමේන්තුව, කුරුණෑගල
20. නාගරික කොමසාරිස්, කුරුණෑගල

1-27

---

## 1952 කේ නො. 12 දරණ සෞඛ්‍ය සේවා පණත

අනුරාධපුර ආරෝග්‍යශාලා මණ්ඩලය

1952 කේ නො. 12 දරණ සෞඛ්‍ය සේවා පණතෙහි 11 වෙනි වගන්තිය යටතේ 1962 ජනවාරි මස 1 වෙනි දින පටන් 1962 දෙසැම්බර් මස 31 වෙනි දින දක්වා පහත සඳහන් අය අනුරාධපුර ආරෝග්‍යශාලා මණ්ඩලයේ සාමාජිකයින් වශයෙන් ගරු සෞඛ්‍ය ඇමතිතුමා විසින් පත් කරනු ලැබූහ. එහි සභාපති වශයෙන් එච්. ඒ. ජයවික්‍රම මහතා නම් කරනු ලැබිය.

එල්. එස්. බී. පෙරේරා,
ස්ථිර ලේකම්.

1961 දෙසැම්බර් මස 18 වෙනි දින,
කොළඹ, සෞඛ්‍ය අමාත්‍යාංශයේදීය.

### නාම ලේඛනය

1. එච්. ඒ. ජයවික්‍රම මහතා
2. එෆ්. පී. සේනාරත්න මහතා
3. එස්. දළුවත්ත මහතා
4. ඒ. මල්හාමි මහතා
5. සුල්ටාන් ඉස්මයිල් මහතා
6. දොස්තර ටී. ඒ. බුලන්කුලම මහතා
7. ඩී. තිලකවර්ධන මහතා
8. ඩී. ඒ. දසනායක මහතා
9. එස්. එම්. කේ. හේරත්හාමි මහතා
10. අනුරාධපුර සෞඛ්‍ය සේවා අධිකාරි
11. උතුරු මැද කොට්ඨාශයේ අධිකාරි ඉංජිනේරු තැන, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුව, අනුරාධපුර

1-26

---

## 1952 කේ නො. 12 දරණ සෞඛ්‍ය සේවා පණත

### අංගොඩ මානසික ආරෝග්‍යශාලා මණ්ඩලය

1952කේ නො. 12 දරණ සෞඛ්‍ය සේවා පණතෙහි 11 වෙනි වගන්තිය යටතේ 1962 ජනවාරි මස 1 වෙනි දින පටන් 1962 දෙසැම්බර් මස 31 වෙනි දින දක්වා පහත සඳහන් අය අංගොඩ මානසික ආරෝග්‍යශාලා මණ්ඩලයේ සාමාජිකයින් වශයෙන් ගරු සෞඛ්‍ය ඇමතිතුමා විසින් පත් කරනු ලැබූහ. එහි සභාපති වශයෙන් දොස්තර ඩබ්ලිව්. එෆ්. ජයසූරිය මහතා නම් කරනු ලැබීය.

එල්. එස්. බී. පෙරේරා,
ස්ථිර ලේකම්.

1961 දෙසැම්බර් මස 18 වෙනි දින,
කොළඹ, සෞඛ්‍ය අමාත්‍යාංශයේදීය.

### නාම ලේඛනය

1. දොස්තර ඩබ්ලිව්. එෆ්. ජයසූරිය මහතා,
2. දොස්තර අයි. ඒ. සේනානායක මහතා,
3. දොස්තර සී. එෆ්. ඩියුට්‍රම් මහතා,
4. සී. ටී. සිම්ත්‍රාරච්චි මැතිණිය,
5. මුහන්දිරම් ඩී. එස්. සී. උමගිලිය මහතා,
6. පුෂ්පා හේවාවිතාරණ මැතිණිය,
7. ජේ. ටී. උඩුගම්පොල මහතා,
8. දොස්තර ටී. ආර්. ටැබට් මහතා,
9. එල්. ඒ. පෙරේරා මහතා,
10. කොළඹ සෞඛ්‍ය සේවා අධිකාරි,
11. ගොඩනැගිලි පිළිබඳ අධිකාරි ඉංජිනේරු තැන, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුව, කොළඹ,
12. කොළඹ දිස්ත්‍රික්කයේ කාෂිකම් ව්‍යාප්ත නිලධාරී.

1-25

---

## 1952 කේ නො. 12 දරණ සෞඛ්‍ය සේවා පණත

### මඩකලපුවේ ආරෝග්‍යශාලා මණ්ඩලය

1952කේ නො. 12 දරණ සෞඛ්‍ය සේවා පණතෙහි 11 වෙනි වගන්තිය යටතේ 1962 ජනවාරි මස 1 වෙනි දින පටන් 1962 දෙසැම්බර් මස 31 වෙනි දින දක්වා පහත සඳහන් අය මඩකලපුවේ ආරෝග්‍යශාලා මණ්ඩලයේ සාමාජිකයින් වශයෙන් ගරු සෞඛ්‍ය ඇමතිතුමා විසින් පත් කරනු ලැබූහ. එහි සභාපති වශයෙන් එස්. ඒ. සෙල්වනායගම් මහතා නම් කරනු ලැබීය.

එල්. එස්. බී. පෙරේරා,
ස්ථිර ලේකම්.

1961 දෙසැම්බර් මස 18 වෙනි දින,
කොළඹ, සෞඛ්‍ය අමාත්‍යාංශයේදීය.

### නාම ලේඛනය

1. එස්. ඒ. සෙල්වනායගම් මහතා,
2. ජේ. එල්. තිසවරසිංහ මහතා,
3. ඩබ්ලිව්. ඔලගසේගරම් මැතිණිය,
4. සී. කුරුනේරු මහතා,
5. දොස්තර ඒ. කාරාලසිංගම් මහතා,
6. එම්. අයි. එම්. කසිම් හජ්ජියාර් මහතා,
7. ඒ. එල්. අහමඩ් ලේබ්බේ මහතා,
8. සී. එස්. පූපාලරත්නම් මහතා,
9. මඩකලපුවේ සෞඛ්‍ය සේවා අධිකාරි,
10. නැගෙනහිර කොට්ඨාශයේ අධිකාරි ඉංජිනේරු තැන, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුව, මඩකලපුව.
11. ලේකම්, පළාත් ආණ්ඩු සභාව, මඩකලපුව.

1-24

---

## 1952 කේ නො. 12 දරණ සෞඛ්‍ය සේවා පණත

### උතුරු කොළඹ ආරෝග්‍යශාලා මණ්ඩලය

1952කේ නො. 12 දරණ සෞඛ්‍ය සේවා පණතෙහි 11 වෙනි වගන්තිය යටතේ 1962 ජනවාරි මස 1 වෙනි දින පටන් 1962 දෙසැම්බර් මස 31 වෙනි දින දක්වා පහත සඳහන් අය උතුරු කොළඹ ආරෝග්‍යශාලා මණ්ඩලයේ සාමාජිකයින් වශයෙන් ගරු සෞඛ්‍ය ඇමතිතුමා විසින් පත් කරනු ලැබූහ. එහි සභාපති වශයෙන් ගිල්බට් ගුණසේකර මහතා නම් කරනු ලැබිය.

එල්. එස්. බී, පෙරේරා,
ස්ථිර ලේකම්.

1961 දෙසැම්බර් මස 18 වෙනි දින,
කොළඹ, සෞඛ්‍ය අමාත්‍යාංශයේදීය.

### නාම ලේඛනය

1. ගිල්බට් ගුණසේකර මහතා,
2. ෂෙල්ටන් පෙරේරා සිරිවර්ධන මහතා,
3. ඩී. ඔලිවර් ජයසූරිය මහතා,
4. ෂෙල්ටන් ජයසිංහ මැතිණිය,
5. ජේරාඩ් හල්පේ මහතා,
6. ආතර් පෙරේරා මහතා,
7. කොළඹ සෞඛ්‍ය සේවා අධිකාරි,
8. බටහිර කොට්ඨාශයේ අධිකාරි ඉංජිනේරු තැන, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුව, කොළඹ,
9. ලේකම්, ගම්කාර්ය සභාව, කඳාන.

1-23

---

## 1952 කේ නො. 12 දරණ සෞඛ්‍ය සේවා පණත

### රත්නපුර ආරෝග්‍යශාලා මණ්ඩලය

1952කේ නො. 12 දරණ සෞඛ්‍ය සේවා පණතෙහි 11 වෙනි වගන්තිය යටතේ 1962 ජනවාරි මස 1 වෙනි දින පටන් 1962 දෙසැම්බර් මස 31 වෙනි දින දක්වා පහත සඳහන් අය රත්නපුර ආරෝග්‍යශාලා මණ්ඩලයේ සාමාජිකයින් වශයෙන් ගරු සෞඛ්‍ය ඇමතිතුමා විසින් පත් කරනු ලැබූහ. එහි සභාපති වශයෙන් එල්. සී. විජේසිංහ මහතා නම් කරනු ලැබිය.

එල්. එස්. බී. පෙරේරා.
ස්ථිර ලේකම්.

1961 දෙසැම්බර් මස 16 වෙනි දින,
කොළඹ, සෞඛ්‍ය අමාත්‍යාංශයේදීය.

### නාම ලේඛනය

1. එල්. සී. විජේසිංහ මහතා,
2. එල්. ද එස්. ඒ. ගුණසේකර මැතිණිය,
3. ජී. පී. හේවාවිතාරණ මහතා,
4. එම්. ජී. සිරිසේන මහතා,
5. එම්. සී. ප්‍රනාන්දු මැතිණිය,
6. ඇම්. ඩී. ජේ. විමලජීව මහතා,
7. ඩී එල්. ඩබ්ලිව්. තෙන්නකෝන් මහතා,
8. ඩබ්ලිව්. කේ. විජේවර්ධන මහතා,
9. අයෝමා වේරගම මෙනෙවිය,
10. එස්. එම්. ඩී. පීරිස් මැතිණිය,
11. ටී. ඩී. ඒකනායක මහතා,
12. රත්නපුර සෞඛ්‍ය සේවා අධිකාරි,
13 සබරගමු කොට්ඨාශයේ අධිකාරි ඉංජිනේරු තැන, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුව. රත්නපුර,
14. ලේකම්, පළාත් ආණ්ඩු සභාව, රත්නපුර.

1-22

---

## 1952 කේ නො. 12 දරණ සෞඛ්‍ය සේවා පණත

### යාපනයේ ආරෝග්‍යශාලා මණ්ඩලය

1952කේ නො. 12 දරණ සෞඛ්‍ය සේවා පණතෙහි 11 වෙනි වගන්තිය යටතේ 1962 ජනවාරි මස 1 වෙනි දින පටන් 1962 දෙසැම්බර් මස 31 වෙනි දින දක්වා පහත සඳහන් අය යාපනයේ ආරෝග්‍යශාලා මණ්ඩලයේ සාමාජිකයින් වශයෙන් ගරු සෞඛ්‍ය ඇමතිතුමා විසින් පත් කරනු ලැබූහ. එහි සභාපති වශයෙන් දොස්තර වී. ටී. පාසුපති මහතා නම් කරනු ලැබිය.

එල්. එස්. බී. පෙරේරා,
ස්ථිර ලේකම්.

1961 දෙසැම්බර් මස 21 වෙනි දින,
කොළඹ, සෞඛ්‍ය අමාත්‍යාංශයේදීය.

### නාම ලේඛනය

1. දොස්තර වී. පී. පාසුපති මහතා,
2. දොස්තර ආර්. ටී. ඩබ්ලිව්. ජේහොරත්නම් මහතා,
3. ටී. පී. සරවනමුත්තු මැතිණිය,
4. එම්. ඒ. එම්. සුල්ටාන් මහතා,
5. ඒ. තුරේරාජසිංහම් මහතා,
6. කේ. ගුණරත්නම් මහතා,
7. එස්. සුබ්‍රමණියම් මහතා,
8. ජී. වී. බාලසිංගම් මහතා,
9. එස්. එම්. ටිජ්වේ මහතා,
10. දොස්තර ආර්. කන්දසියා මහතා,
11. එස්. සී. මහාදේව මහතා,
12. එස්. පී. වෙලාවුදපිල්ලේ මහතා,
13. දොස්තර ධර්මලිංගම් මහතා,
14. එස්. මුතුකුමාරසාමි මහතා,
15. එම්. වේලුම්මයිලම් මහතා,
16. එස්. සී. කතිරවේලු මහතා,
17. එම්. ඒ. සී. ඒ. කාදර් මහතා,
18. එම්. කතිරවේලු මහතා,
19. දොස්තර කේ. කනගරත්නම් මහතා,
20. එම්. පූපාලසිංහම් මහතා,
21. යාපනයේ සෞඛ්‍ය සේවා අධිකාරි,
22. උතුරු කොට්ඨාශයේ අධිකාරි ඉංජිනේරු තැන, රජයේ වැඩ දෙපාර්තමේන්තුව, යාපනය,
23. නාගරික කොමසාරිස්, යාපනය.

1-21

---

## 1952කේ නො. 12 දරණ සෞඛ්‍ය සේවා පණත

### බදුල්ලේ ආරෝග්‍යශාලා මණ්ඩලය

1952කේ නො. 12 දරණ සෞඛ්‍ය සේවා පණතෙහි 11 වෙනි වගන්තිය යටතේ 1962 ජනවාරි මස 1 වෙනි දින පටන් 1962 දෙසැම්බර් මස 31 වෙනි දින දක්වා පහත සඳහන් අය බදුල්ලේ ආරෝග්‍යශාලා මණ්ඩලයේ සාමාජිකයින් වශයෙන් ගරු සෞඛ්‍ය ඇමති තුමා විසින් පත් කරනු ලැබූහ. එහි සභාපති වශයෙන් ටී. බී. දිඹුලාන මහතා නම් කරනු ලැබිය.

එල්. එස්. බී. පෙරේරා.
ස්ථිර ලේකම්.

1961 දෙසැම්බර් මස 18 වෙනි දින,
කොළඹ, සෞඛ්‍ය අමාත්‍යාංශයේ දී ය.

### නාම ලේඛනය

(1) ටී. බී. දිඹුලාන මහතා.
(2) දොස්තර ටී. ඒ. ඇන්ඩි මහතා.
(3) ආර්. ඇම්. අප්පුහාමි මහතා.
(4) එස්. රාජේන්ද්‍රන් මහතා.
(5) ජී. පී. මාටින් ස්ල්වා මහතා.
(6) කමලා අබයකෝන් මැතිණිය.
(7) පී. එම්. ආරියරත්න මහතා.
(8) ඒ. එම්. සිංහසේන මහතා.
(9) ඩී. එල්. යූ. බණ්ඩාර මහතා.
(10) එච්. එම්. ජයසේන මහතා,
(11) එල්. එම්. ඇන්ඩංසන් සිල්වා මහතා.
(12) බදුල්ලේ සෞඛ්‍ය සේවා අධිකාරි.
(13) ඌව කොට්ඨාශයේ අධිකාරි ඉණ්ජිනේරු තැන, රජයේ වැඩ දෙපාංතමේන්තුව, බදුල්ල.
(14) ලේකම්, පළාත් ආණ්ඩු සභාව, බදුල්ල.

1-20

---

## 1952කේ නො. 12 දරණ සෞඛ්‍ය සේවා පණත

### මහනුවර ආරෝග්‍යශාලා මණ්ඩලය

1952කේ නො. 12 දරණ සෞඛ්‍ය සේවා පණතෙහි 11 වෙනි වගන්තිය යටතේ 1962 ජනවාරි මස 1 වෙනි දින පටන් 1962 දෙසැම්බර මස 31 වෙනි දින දක්වා පහත සඳහන් අය මහනුවර ආරෝග්‍යශාලා මණ්ඩලයේ සාමාපකයින් වශයෙන් ගරු සෞඛ්‍ය ඇමති තුමා විසින් පත් කරනු ලැබූහ. එහි සභාපති වශයෙන් දොස්තර පි. ආර. තෙන්නකෝන් මහතා නම කරනු ලැබී ය.

එල්. එස්. බී. පෙරේරා.
ස්ථිර ලේකම්.

1961 දෙසැම්බර් මස 16 වෙනි දින,
කොළඹ, සෞඛ්‍ය අමාත්‍යාංශයේ දී ය.

### නාම ලේඛනය

(1) දොස්තර පී. ආර්. තෙන්නකෝන් මහතා.
(2) ඒ. එස්. කරුණාරත්න මහතා.
(3) මේජර් ගෝඩන් පයිපර් මහතා.
(4) එන්. එච්. කුමාරසිංහ මහතා.
(5) හජ්ජියාර් එම්. එල්. එම්. හනීfපා මහතා.
(6) සී. ආර්. කේ. වීරසිංහ මහතා.
(7) මහින්ද සේනානායක මහතා.
(8) දොස්තර පී. ද එස්. විජේසේකර මහතා.
(9) ඒ. සී. එම්. fපලීල් මහතා.
(10) දොස්තර ගැමුණු කරුණාරත්න මහතා.
(11) දොස්තර ඩැනියෙල් ද සිල්වා මහතා.
(12) සී. එම්. කරුණාරත්න මහතා.
(13) කේ. බී. සමරකෝන් මහතා.
(14) එස්. ජේ. තාඹුගල මහතා.
(15) මේජර් පී. සී. පැල්පොළ මහතා.
(16) එස්. එම්. ඒ. රසාක් මහතා.
(17) කේ. බී. අලහකෝන් මහතා.
(18) සී. එම්. කේ. බණ්ඩාර මහතා.
(19) ඒ. සී. එම්. මර්ජාන් මහතා.
(20) එල්. කුලතුංග මහතා.
(21) සී. ඩබ්ලිව්. ද. ඇස්. ගමගේ මහතා.
(22) පී. බී. උනන්තැන්න මහතා.
(23) යූ. බී. දොලපිහිල්ල මහතා.
(24) මහනුවර සෞඛ්‍ය සේවා අධිකාරි.
(25) මහනුවර නාගරික කොමසාරිස්.

1-19

---

## 1952කේ නො. 12 දරණ සෞඛ්‍ය සේවා පණත

### ගාල්ලේ ආරෝග්‍යශාලා මණ්ඩලය

1952කේ නො. 12 දරණ සෞඛ්‍ය සේවා පණතෙහි 11 වෙනි වගන්තිය යටතේ 1962 ජනවාරි මස 1 වෙනි දින පටන් 1962 දෙසැම්බර් මස 31 වෙනි දින දක්වා පහත සඳහන් අය ගාල්ලේ ආරෝග්‍යශාලා මණ්ඩලයේ සාමාජිකයින් වශයෙන් ගරු සෞඛ්‍ය ඇමතිතුමා විසින් පත් කරනු ලැබූහ. එහි සභාපති වශයෙන් ඩබ්ලිව්. පී. විජේකුලසූරිය මහතා නම් කරනු ලැබීය.

එල්. ඒස්. බී. පෙරේරා.
ස්ථිර ලේකම්.

1961 දෙසැම්බර් මස 16 වෙනි දින,
කොළඹ, සෞඛ්‍ය අමාත්‍යාංශයේ දී ය.

### නාම ලේඛනය

(1) ඩබ්ලිව්. පී. විජේකුලසූරිය මහතා.
(2) ඩී. ඒ. එස්. පී. දහනායක මහතා.
(3) ටී. ඒ. ගුණතිලක මැතිණිය.
(4) පී. බී. ද සිල්වා මහතා.
(5) ආයුර්වේද වෛද්‍ය එන්.එස්. තන්තිරිගේ මහතා.
(6) එච්. කේ. එඩ්මන් මහතා.
(7) ටී. එම්. ද සිල්වා මහතා.
(8) ජේ. එල්. පියසේන මහතා.
(9) අධිනීතිඥ එම්. එස්. ඒ. හසන් මහතා.
(10) කේ. ජී. ජේ. ජයවර්ධන මහතා.
(11) ඩබ්ලිව්. සී. දසනායක මහතා.
(12) එච්. ඒ. පියසේන මහතා.
(13) ඩී. වයි. විජේවික්‍රම මහතා.
(14) දොස්තර ඩී. යූ. ද. එස්. කුලරත්න මහතා
(15) ගාල්ලේ සෞඛ්‍ය සේවා අධිකාරී තැන.
(16 අධිකාරි ඉංජිනේරු තැන, දකුණු කොට්ඨාශය, ආණ්ඩුවේ වැඩ දෙපාරතමේන්තුව ගාල්ල.
(17) නාගරික කොමසාරිස්, ගාල්ල.

1-18

---

## 1952කේ නො. 12 දරණ සෞඛ්‍ය සේවා පණත

### කොළඹ ගණයට අයත් ආරෝග්‍යශාලා මණ්ඩලය

1952කේ නො. 12 දරණ සෞඛ්‍ය සේවා පණතෙහි 11 වෙනි වගන්තිය යටතේ 1962 ජනවාරි මස 1 වෙනි දින පටන් 1962 දෙසැම්බර මස 31 වෙනි දින දක්වා පහත සඳහන් අය කොළඹ ගණයට අයත් ආරෝග්‍යශාලා මණ්ඩලයේ සාමාජිකයින් මෙන් ගරු සෞඛ්‍ය ඇමතිතුමා විසින් පත් කරනු ලැබූහ. එහි සභාපති වශයෙන් වී. එම්. ද මැල් මහතා නම් කරනු ලැබීය.

එල්. එස්. බී. පෙරේරා.
ස්ථිර ලේකම්.

1961 දෙසැම්බර් මස 16 වෙනි දින,
කොළඹ, සෞඛ්‍ය අමාත්‍යාංශයේ දී ය.

### නාම ලේඛනය

(1) වී. එම්. ද මැල් මහතා.
(2) දොස්තර ඒ. ඩී. පී. ඒ. විජේගුණවර්ධන මහතා.
(3) ජී. වී. ආර්. සමරවික්‍රම මහතා.
(4) මහාචාර්ය ඕ. ඊ. ආර්. අභයරත්න.
(5) දොස්තර ඊ. එම්. විජේරාම මහතා.
(6) තෝමස් අමරසූරිය මැතිණිය
(7) එල්. ඊ. පී. රාජකරුණා මහතා.
(8) යූ. කේ. පී. සිල්වා මහතා.
(9) විවියන් ගුණවර්ධන මැතිණිය.
(10) ජේ. ආර්. මචාඩෝ මහතා.
(11) දොස්තර එම්. ඩී. එස්. ජයවර්ධන මහතා.
(12) එෆ්. එච්. පුවිමාන්නසිංහ මහතා.
(13) සී. එස්. කුමාරස්වාමි මහතා.
(14) දොස්තර එල්. ඕ. අබේරත්න මහතා.
(15) කේ. සී. ද සිල්වා මැතිණිය.
(16) නියෝජ්‍ය අධ්‍යක්ෂ (වෛද්‍ය සේවා).
(17) කොළඹ නාගරික කොමසාරිස්.
(18) රජයේ වැඩ අධ්‍යක්ෂ.

1-17

---

## කාර්මික අධ්‍යාපනය පිළිබඳ පරීක්ෂණ කොමිෂන් සභාව 1961

**අතිරේක නිවේදනයයි**

1961 නොවැම්බර් 20 වැනි දින හා දෙසැම්බර් 2 වැනි දින දෛනික ප්‍රවෘත්ති පත්‍රවල සහ 1961 නොවැම්බර් 24 වැනි දින රජයේ ගැසට් පත්‍රයෙහිද ප්‍රකාශ කරන්නට යෙදුන, 1961 නොවැම්බර් මස 18 වැනි දින දරන මාගේ දැන්වීමට අමතරව ලිඛිත සංදේශ ඉදිරිපත් කිරීමටද "ඊ" ආකෘති පත්‍රයෙහි සාමාන්‍ය ප්‍රශ්න මාලාවට පිළිතුරු සැපයීමටද "අ, ආ. සහ ඉ." අංකිත ආකෘති පත්‍රයන්හි තොරතුරු සැපයීමටද නියමිත දිනය 1962 ජනවාරි 15 වැනි දින දක්වා දීර්ඝ කරනු ලැබේ.

2. එබඳු කරුණු කොමිෂන් සභාවේ පරීක්ෂණයට භාජන වූ කරුණු තුළට වැටෙන්නේ නම් "ඊ" අංකිත ආකෘති පත්‍රයෙහි වූ මුද්‍රිත සාමාන්‍ය ප්‍රශ්න මාලාවට පිළිතුරු හැර හෝ ඊට අමතරව, ලිඛිත සන්දේශ ඉදිරිපත් කළ හැකි බව මහජනයාද සංගම් හා සමිතිද වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

3. රජයේ නිලධාරීන්ට කොමිෂන් සභාවේ පරීක්ෂණයට භාජන වූ කරුණු පිළිබඳ ලිඛිත සන්දේශයන් සවකීය දෙපාර්තමේන්තු ප්‍රධානයන් මගින් ඉදිරිපත් කරනවා වෙනුවට කැමති නම් කොමිෂන් සභාවේ ලේකම්වරයා වෙත කෙළින්ම එවිය හැකිය.

4. "ආ" ආකෘති පත්‍රය මිනිස් බලප්‍රමාණ සමීක්ෂණයක කාර්‍ය්‍යයන් සඳහා අදහස් කර තිබෙන බව විශේෂයෙන් සැලකිය යුත්තකි. එබැවින් ආරම්භ කර තිබෙන ක්‍රියාකාරිත්වය කවර වර්‍ගයකට අයත් වූවත් පහළම, මධ්‍යම හෝ ඉහළම වශයෙන් කවර හෝ ශ්‍රේණියක සෑම ගණයකම අයත් පුහුණු හෝ අර්ධ—පුහුණු සේවකයන් රක්ෂාවෙහි යොදන සෑම සේව්‍යයකු විසින්ම මෙම ආකෘති පත්‍රය පිරිවිය යුතුය. දැනටම මෙම තොරතුරු සපයා නැති සියලුම පෞද්ගලික හෝ රජයේ ආයතන වෙළඳ සමාගම්, සංවිධාන හා දෙපාර්තමේන්තු විසින් අප්‍රමාදව ඒවා එවන මෙන් ඉල්ලනු ලැබේ.

5. සුළු කර්මාන්ත අරඹන හෝ ඇරඹීමට අදහස් කරන තැනැත්තන් විසින් "ආ" ආකෘති පත්‍රයෙහි සවකීය පුහුණු මිනිස් බලප්‍රමාණයේ අවශ්‍යකතාවන්ද සඳහන් කරන්නේ නම් එය කොමිෂන් සභාවට උපකාර වනු ඇත.

6. ආයතන බෝහෝමයකට ආකෘති පත්‍ර තැපැල් කර තිබේ. ආකෘති පත්‍ර ලැබී නැති ආයතන විසින් ඒවා මේ කාර්‍ය්‍යාලයෙන් ලබාගත යුතුයි. සියලුම ලියකියමන් කාර්මික අධ්‍යාපන කොමිෂන් සභාවේ ලේකම් වෙත කරුණාකර එවනු මැනවි. තවද ඒවා කිසිවකුගේ නමට පෞද්ගලික වශයෙන් එවිය යුතු නොවේ.

ආර්. විජේසිංහ,
කාර්මික අධ්‍යාපනය පිළිබඳ පරීක්ෂණ කොමිෂන් සභාවේ ලේකම්.

1961 දෙසැම්බර් 20 වැනි දින,
කොළඹ 2, මලයි වීදියේ,
කාර්මික අධ්‍යාපන කොමිෂන් සභා කාර්‍ය්‍යාලයේදිය.

1-1

---

## 1950 අංක 29 දරණ මිල පාලන පනත

පහත පෙනෙන උපලේඛනයේ සඳහන් නියෝග මවිසින් පිළිගනු ලැබූ බව 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 4 වෙනි වගන්තියේ 7 වෙනි අතුරු වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ටී. බී. ඉලංගරත්න,
වාණිජ, වෙළඳ, ආහාර හා නැව් කටයුතු පිළිබඳ ඇමති.

1961.12.28 දින,
කොළඹදී ය.

### උපලෙඛනය

| දිනය | නියෝග දුන් බලධාරියා | නියෝගය නිකුත් කරන ලද ද්‍රව්‍ය | නියෝගය පළ කරන ලද ගැසට් පත්‍රය |
|---|---|---|---|
| 61.12. 4 | ... මිළ (ආහාර) පාලක | ... සීනි (සකස් කරන ලද සුදු සීනි හා සකස් නොකරන ලද දුඹුරු සීනි) | 61.12.4 වැනි දින අංක 12,794 |
| 61.12.15 | ... මිළ (ආහාර) පාලක | ... අතිරේක ආහාර ද්‍රව්‍ය | ... 61.12.15 වැනි දින අංක 12,825 |

1—39

---

## 1954 අංක 37 දරණ ජාතික නිවාස පනත 49 ඡේදය යටතේ සහතිකය

පළාත් පාලන හා නිවාස පිළිබඳ ඇමතිවර, මහනාම සමරවීර වන මම, 1954 අංක 37 දරණ ජාතික නිවාස පනතේ 49 වන ඡේදය යටතේ මා වෙත පවරා ඇති බලතල උඩ මෙහි පහත සඳහන් උප ලේඛනයෙහි විස්තර කර ඇති ඉඩම එම පනතෙහි 2 වන ඡේදයෙහි අදහසට ඇතුළත් නිවාස අරමුණක් ක්‍රියාත්මක කිරීම සඳහා රජය මගින් අත්කර ගත යුතු බව මෙයින් සහතික කරමි.

මහානාම සමරවීර,
පළාත් පාලන හා නිවාස ඇමති තුමා.

1961 දෙසැම්බර් මස 19 වෙනි දින දීය,
කොළඹ 2.

### උපලේඛනය

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ නුගේගොඩ ආදායම් පාලක කොට්ඨාශයේ දකුණු රත්මලාන ගම්මුලාදැනි වසමේ, ගාමිණී මාවතේ වරිපනම් අංක 53/4 දරණ "තල්ගහවත්ත" නැමැති ඉඩමෙන් පහත සඳහන් පරිදි පර්චස් 27½ක පමණ ප්‍රමාණයක ඉඩම් කොටසක්.

උතුරට : ගාමිණී මාවත; නැගෙනහිරට : එම ඉඩමේම අංක 3 දරණ ඉඩම් කොටස; දකුණට : ඩබ්ලිව්. ඇන්. ඩී. පොන්සේකාට අයිති ඉඩම්; බස්නාහිරට : වරිපනම් අංක 53/3 දරණ ඉඩම සහ ගාමිණී මාවත.

1-30

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## 1960 ලංකාවේ ජීවිත සංඛ්‍යා පිළිබඳ ප්‍රාරම්භක වාර්තාව

1960 ජීවිත සංඛ්‍යා පිළිබඳ වැදගත ලක්ෂණයන්හි සාරාංශය පහත සඳහන් වේ :—

**ජනගහනය**

ලංකාවේ ඇස්තමේන්තු කරණලද ජනගහනය වර්‍ෂයේ මැද භාගයෙහි 9,896,000 ක්ද වර්‍ෂය අවසාන භාගයෙහි 10,030,000ක් ද විය. වසර තුල දිවයිනේ ජනගහනය පිළිබඳ වැඩිවූ සියයට ගණන 2.8 සමග සසැඳීමේදී 1959 වසරෙහි එම සංඛ්‍යාව 2.7ක් වී ඇත. මරණවලට වඩා ඉපදීමට වැඩිවීම් (ස්වාභාවික වැඩිවීම) සංඛ්‍යාව 276,784 ක් විය. පිටරටින් මෙරට පදිංචිය සොයා පැමිණි ගණනට වඩා මෙරටින් පිටරට පදිංචිය සොයා ගිය ගණන 6,022 කි.

1953 නේ ජන ලේඛන ගැනීමේදී ඇතුළත් නොවූ වයස අවුරුදු 5 ට අඩු ළමුන් ඇතුළත් කොට නිදොස් කරනු සඳහා ක්‍රමවත්ව යොදන ලද සංඛ්‍යාවකින් ඉහත සඳහන් ජනගහනමය ඇස්තමේන්තු සමන්විතව ඇත. මෙහි ප්‍රසිද්ධ කරණ ලද ප්‍රමාණයන් මෙතයින් සදොස් ඇස්තමේන්තු ජනගහනයට අනුව බැව් සැළකිය යුතුයි.

**විවාහ**

උඩරට හා සාමාන්‍ය විවාහ අණපනත් පරිදි 56,152ක් විවාහ සිදුවී ඇත. මෙයින් 47,674 ක් සාමාන්‍ය විවාහ වශයෙන්ද 8,478 ක් උඩරට විවාහ වශයෙන්ද ලියාපදිංචි කොට තිබේ. 1959 වසරෙහි සිදු කරණ ලද විවාහ සංඛ්‍යාව 55,633කි. මුස්ලිම් නොවන ජනගහනය මය

විවාහ පිළිබඳ 1,000 ට වැඩිවීමේ ප්‍රමාණය සලකා බලත්ම එම සංඛ්‍යාව 1960 වසරේදී 6.1 ක් සහ 1959 වසරේදී 6.2 ක් බැව් පෙණීන. වසර තුල ලියාපදිංචි කරණ ලද මුස්ලිම් විවාහ සංඛ්‍යාව 5,616 ක් වේ. 1959 වසරෙහි එම සංඛ්‍යාව 5,667 කි. 1959 සහ 1960 යන දෙවසර තුල සිදුවූ මුස්ලිම් විවාහ සංඛ්‍යාවේ දාහට ප්‍රමාණය පිළිවෙලින් 8.5 සහ 8.8 ක්ය.

### උපත්

1960 වසර තුල සිදුවී ඇති උපත් සංඛ්‍යාව 361,702 ක් (පිරිමි 183,799 සහ ගැහැණු 177,903) හෙයින් මෙම සංඛ්‍යාව 1959 වසරට වඩා 5,366 කින් අධික වී ඇත තේය.

උපත්හි ලිංගික අනුපාතය පිරිමි 1,033 ට ගැහැණු 1,000 කි. ජනගහනය 1959 සහ දෙවසර සඳහා ජනගහනය වැඩිවීමේ ප්‍රමාණය පිළිවෙලින් 1,000 ට 37.0 හා 36.6ක් වේ. කොළඹ නගරයෙහි 1960 තිදි උපත් 33,652 ක් ලියාපදිංචි කොට ඇත. නේවාසික ජනගහනය ප්‍රමාණය 31.2 ක්වූ අතර එම සංඛ්‍යාව 1959 දි 32.3 ක් බැව් පෙනේ. උපත් 35,718ක් වතුවල සිදුවූ උපත් බවට ලියාපදිංචිය ලබන ලදී. 1959 වසර තුලදී වතුවල සිදුවී ඇත්තේ උපත් 34,259 ක් පමණය.

### මරණ

මරණ 84,918 ක් (පිරිමි 44,654 ක් හා ගැහැණු 40,264 කි). 1960 වසර තුල ලියාපදිංචි කොට තිබෙන අතර 1959 වසර සඳහා අදාලවූ එම සංඛ්‍යාව 87,971 ක්වේ. වසරේ මරණ ප්‍රමාණය (එනම් 8.6) මෙතෙක් සටහන් ගත ඉතාම අඩු මරණ ප්‍රමාණය වී තිබේ. පසුගිය වසරෙහි සටහන් ගතවූ මරණ ප්‍රමාණය 9.1 කි. කොළඹ නගරයෙහි ලියාපදිංචි කරණ ලද මරණ සංඛ්‍යාව 7,867 වූ අතර 1959 වසරෙහි එම සංඛ්‍යාව 8,227 ක විණ. 1959 වසර හා සසඳා බලත්ම නගරය තුල නේවාසික ජනගහනමය ප්‍රමාණය 1960 ද 8.1 ක් හා 1959 දී 8.9 ක් බැව් පැහැදිලිවේ. 1960 වසරේදී මරණ 10,885 ක්ද 1959 දී මරණ 10,911 ක්ද වතුවල සිදුවී තිබේ.

### ළදරු මරණ

විවේචනයට ලක්ව ඇති වසරෙහි ලියාපදිංචි කරණ ලද මරණ සංඛ්‍යාවෙන් 20,549 ක් ළදරු මරණ බැව් ගණින් බලා ඇත. 20,500 ක් ළදරු මරණ 1959 දි සිදුවී තිබිණ. ජීවී උපත් හා ළදරු මරණ ගණන් ගැනීමේදී ඒවාට සම්බන්ධ ප්‍රමාණය 1,000 ට 57 කි. 1959 වසරේ මෙම ප්‍රමාණය 58 ක්ව තිබිණ. 1960 වාර්තාගත ප්‍රමාණය මෙතෙක් වාර්තාවී ඇති අඩු ප්‍රමාණය බවට පත්ව තිබේ. කොළඹ නගරයෙහි නේවාසික සංඛ්‍යාව ප්‍රමාණය පසුගිය වසර හා සසඳා බැලීමේදී එය 61 සහ 63 (පසුගිය වසරෙහි) බැව් ගණින් බලා ඇත. පිළිවෙලින් 1960 සහ 1959 යන දෙවසර තුල වතුකරයෙහි ළදරු මරණ ප්‍රමාණය 100 සහ 99 යත්ය.

### මාතෘ මරණ

1960 වසරේ ගැබ්ගැනීමෙන් හා ගැබ් දරීමෙන් 1,094 ක් මරණ සිදුව තිබේ. මෙම අංකය 1959 දි 1,207 කි. මාතෘ මරණ ප්‍රමාණය 3.0 සි. කොළඹ නගරයෙහි නේවාසිකයන පිළිබඳ ප්‍රමාණය 1.5 කි. වතුකර යෙහි සටහන්වූ ජීවී උපත් ප්‍රමාණය 1,000 ට 2.5 ක් විය.

ඒ. ආම්. ආස්. පෙරේරා,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය,
කොළඹ 1, දෙසැම්බර් 23, 1961.

1–29

---

### 1961 අංක 33 දරණ කෘෂි ද්‍රව්‍ය (නියමිත මිළ සහ වී පැහීම හා එකවීමේ පාලනය) පණතේ 3 වැනි වගන්තිය යටතේ කරන නියෝගය

ගොවිජන සේවා කොමසාරිස් තැන්පත් ජෝසප් වැලන්ටයින් පොන්සේකා වන මම, 1961 අංක 33 දරණ කෘෂි ද්‍රව්‍ය (නියමිත මිළ සහ වී පැහීම හා කෙටීමේ පාලනය) පණතේ 3 වැනි වගන්තිය යටතේ මට පැවරී ඇති බලතල අනුව නියමිත මිළ උපදේශක කාරක සභාව සමඟ සාකච්ඡා කිරීමෙන් පසු කෘෂිකර්ම ඉඩම් වාරිමාර්ග හා විදුලි බලය පිළිබඳ ඇමතිතුමාගේ අනුමැතිය ඇතිව මුදල් ඇමති තුමා සමඟ සාකච්ඡා කිරීමෙන් පසුව ලැබුණු බලයද ඇතිව මෙම නියෝගයෙන් මෙහි පහත සඳහන් උප ලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් කෘෂි ද්‍රව්‍ය සඳහා එම උප ලේඛනයේ 2 වෙනි තීරයේ දක්වා ඇති සහතික මිළ ගණන් නියම කරමි.

ජේ. වී. ෆොන්සේකා,
ගොවිජන සේවා කොමසාරිස්.

ගොවිජන සේවා දෙපාර්තමේන්තුව,
කොළඹ.

1962-1-1.

### උප ලේඛණය

| 1 වෙනි තීරය | | 2 වෙනි තීරය |
|---|---|---|
| | | බුසලක් රු. ශ. |
| 1. | වී ... ... ... ... | 12 00 |
| | | හොන්ඩරයක් රු. ශ. |
| 2. | බඩ ඉරිඟු වර්ග 1 ... ... ... | 16 50 |
| | බඩ ඉරිඟු වර්ග 2 ... ... ... | 12 50 |
| 3. | කුරක්කන් වර්ග 1 ... ... ... | 15 00 |
| | කුරක්කන් වර්ග 2 ... ... ... | 13 00 |
| 4. | ඉදල් ඉරිඟු වර්ග 1 ... ... ... | 15 50 |
| | ඉදල් ඉරිඟු වර්ග 2 ... ... ... | 14 50 |
| 5. | තොර පරිප්පු (ඇට) ... ... ... | 25 76 |
| 6. | මෛරට කපු වර්ග 1 ... ... ... | 57 00 |
| | මෛරට කපු අත්රේක වර්ගය ... ... | 50 00 |
| | මෛරට කපු වර්ග 2 ... ... | 45 00 |
| | මෛරට කපු වර්ග 3 ... ... | 36 00 |
| 7. | අබ ... ... ... | 54 00 |
| 8. | තල ... ... ... | 35 00 |
| 9. | මිරිස් වර්ග 1 ... ... ... | 134 40 |
| | මිරිස් වර්ග 2 ... ... ... | 119 84 |
| | මිරිස් වර්ග 3 ... ... ... | 105 38 |
| 10. | මුංඇට වර්ග 1 ... ... ... | 40 32 |
| | මුංඇට වර්ග 2 ... ... ... | 35 84 |
| 11. | රටකජු ... ... ... | 31 36 |
| 12. | කළු ගම්මිරිස් ... ... ... | 140 00 |
| 13. | මෑ ඇට ... ... ... | 24 00 |
| 14. | රටකපු වර්ග 1 ... ... ... | 49 28 |
| | රටකපු වර්ග 2 ... ... ... | 43 68 |
| 15. | වියළි කහ ... ... ... | 84 00 |
| 16. | කොප්පරා වර්ග 1 ... ... ... | 224 00 |
| | කොප්පරා වර්ග 2 ... ... ... | 154 00 |
| 17. | අර්තාපල් ... ... ... | 22 40 |
| 18. | රතුළූණු වර්ග 1 ... ... ... | 28 00 |
| | රතුළූණු වර්ග 2 (පළමුවෙනි මස ඇතුලත) ... | 21 28 |
| | රතුළූණු වර්ග 2 (සති හය ඇතුලත) ... | 23 52 |
| | රතුළූණු වර්ග 2 (සති 10 ය ඇතුලත) ... | 25 76 |

1–160

---

### අංක 44/61 දරන ආනයන පාලන දැන්වීම

#### සපත්තු පටි ආනයන

කවර රටකින් වුවද සපත්තු පටි ආනයනයට දැන් පෞද්ගලික ආනයන බලපත්‍රයක් අවශ්‍ය බව ආනයනකරුවන් වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ. සාමාන්‍ය ආනයන (රෙදිපිළි) බලපත්‍ර යටතේ හෝ සාමාන්‍ය ආනයන බලපත්‍ර යටතේ හෝ මෙවා ආනයනයට දැන් අවසර නැත.

සියලුම නොනිම් ඇණවුම් වහාම අවලංගු කළ යුතුයි.

සපත්තු පටි ආනයනය සඳහා බලපත්‍ර නිකුත් කරනු නොලැබේ.

ඊ. එස්. ද සිල්වා,
ආනයන හා අපනයන පාලක වෙනුවට.

1961 දෙසැම්බර් මස 30 වෙනි දින,
කොළඹදීය.

1–120

---

### රජයේ වැඩ දෙපාර්තමේන්තුව

වයඹ කොට්ඨාශය. හලාවත දිස්ත්‍රික්කය.

රථවාහනයන්ට විවෘතවීම
මහවත්තේ ගම—ලිනිරියාගම පාර

1961 දෙසැම්බර් මස 29 වැනි දින අංක 12,837 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පලවූ දැන්වීමට අතුරුවිය.

1961.12.21 වැනි දින සිට ඉහත සඳහන් පාර සැහැල්ලු (ටොන් 2½) රථවාහනයන්ට විවෘතව පවතින බව මෙයින් දන්වමි.

ඩී. සී. පෙරේරා,
රජයේ වැඩ අධ්‍යක්ෂක වෙනුවට.

1962 ජනවාරි මස පළමුවැනිදා,
කොළඹ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේදීය.

1–168

දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරනු ලබන ගාස්තු

# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

(සෑම සිකුරාදා දිනයන්හි පළ කරනු ලැබේ)

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයක් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. සතියේ දවස්වල පෙරවරු 9 සිට පස්වරු 4.30 දක්වා ද සෙනසුරාදා දවස්වල පෙරවරු 9 සිට පස්වරු 1 දක්වාද කාර්යාලයේ කටයුතු කරණ කාලය බව සැලකිය යුතුය.

4. සතියේ දවස්වල පස්වරු 3.30ට සහ සෙනසුරාදා දවල් 12ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.

5. සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. තැපෑලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට, ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චැක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෙස් විලක්වා ගැනීම සඳහා. පළ කරන්ට නියමිත "පිටපත" කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි. ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හෝ, නමක් වෙනස් කිරීම පිළිබඳ කරණ දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අන පණත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ පෙරකදෝරු මහතාගෙ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නො ලැබේ.

10. දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරණ ගාස්තු මෙසේයි :—

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... | 10 | 0 |
| වැඩිවන සෑම අඟලට හෝ ඉන් කොටසකට ... ... | 5 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... | 60 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... | 120 | 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.

11. සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරණ දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින තුනකට ප්‍රථම පස්වරු 4ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් අඟහරුවාදා පස්වරු 4ට ප්‍රථමයෙන්).

13. දායක ගාස්තු :—

ආණ්ඩුවේ ගැසට් පත්‍රය—වාර්ෂික

| | මෙරට රු. | මෙරට ශ. | | පිටරට රු. | පිටරට ශ. |
|---|---|---|---|---|---|
| එක් කොටසක් ... ... ... | 22 | 50 | ... | 35 | 50 |
| I වැනි කොටසේ එක ඡේදයක් ... ... | 12 | 50 | ... | 18 | 0 |
| I වැනි කොටසේ ඡේද දෙකක් ... ... | 20 | 0 | ... | 28 | 0 |

වර්ෂය අවසානයේ හෝ අර්ධ වර්ෂයක අවසානයේ නිම වන සේ දායක ගාස්තු භාර ගනුයේ 6 මාසයකට නොඅඩු කාලයකට පමණය.

තනි පිටපත් සඳහා ගාස්තු—(පිටපත් විකිණීමට තිබේ නම්)

| | මිළ රු. | මිළ ශ. | | තැපැල් ගාස්තු මෙරට රු. | තැපැල් ගාස්තු මෙරට ශ. |
|---|---|---|---|---|---|
| (අ) i. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් සතියක් ඇතුලත දී එක කොටසක් ... ... ... | 0 | 25 | ... | 0 | 20 |
| ii. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් සතියකට පසු, එක කොටසක් ... ... ... | 0 | 50 | ... | 0 | 20 |
| (ආ) i. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් සතියක් ඇතුලත දී, I වැනි කොටසේ එක ඡේදයක් ... ... | 0 | 10 | ... | 0 | 15 |
| ii. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් සතියකට පසු, I වැනි කොටසේ එක ඡේදයක් ... ... | 0 | 20 | ... | 0 | 15 |

දායක මුදල් බාරගැනීම සහ තනි පිටපත් විකිණීම බාර, කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සලස්වන්න.

## විශෙෂ නිවේදනයයි

1962 ජනවාරි 19 වැනි සිකුරාදා ආණ්ඩුවේ නිවාඩු දිනයක් වන බැවින්, 1962 ජනවාරි 18 වැනි දින නිකුත්කරනු ලබන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා එවන සියළුම දැන්වීම් සහ නිවේදන, 1962 ජනවාරි 13 වැනි සෙනසුරාදා පස්වරු 12.30 ට ප්‍රථම ආණ්ඩුවේ මුද්‍රණාලයට ලැබෙන්නට සැලැස්විය යුතු බව කාගේත් දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1962 ජනවාරි 5 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

ලංකාවේ වැලව්වේතයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි